පසුගිය විභාග 11 පත්‍රයට අදාළ ගැටළු

## 1 වන පාඩම - තොරතුරු සන්නිවේදන තාක්ෂණය

### 1. අ.පො.ස. (සා.පෙළ) 2016 (1 - iv)

තම බැංකු ගිණුමෙන් මුදල් ආපසු ගැනීම සඳහා ගීතා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක්(ATM)භාවිත කරයි. ඇය පළමුව යන්ත්‍රයට කාඩ්පත ඇතුළත් කර රහස් අංකය ලබා දෙයි. අනතුරුව ඇය තමන්ට ආපසු ගැනීමට අවශ්‍ය මුදල් ප්‍රමාණය ඇතුළත් කරයි. පද්ධතිය මගින් ඇයගේ ගිණුමෙහි ශේෂය සෝදිසි කර, ඇය ආපසු ගැනීමට ඉල්ලා ඇති මුදලට වඩා ගිණුමෙහි ශේෂය වැඩි බැවින් ඉල්ලා ඇති මුදල යන්ත්‍රයෙන් ලබා දෙයි. මීට සමගාමීව පද්ධතිය මගින් ගිණුමෙහි තිබූ ශේෂයෙන් යන්ත්‍රය මගින් ගෙවන ලද මුදල අඩුකර ගිණුමෙහි ශේෂය යාවත්කාලීන කරයි.

ඉහත ක්‍රියාදාමයට අදාළ ව ආදානය, ක්‍රියාවලිය (process)සහ ප්‍රතිදානය සඳහා **එක්** උදාහරණය බැගින් ලියන්න.

### 2. අ.පො.ස.(සා.පෙළ) 2017 (1 - iv)

අභ්‍යාස පොත් තුනක් සහ පෑන් දෙකක් මිලදී ගැනීමට සාමා පොත් සාප්පුවකට යයි. අදාළ අයිතම සොයාගත් පසු ඒවා කවුන්ටරය වෙත ගෙන යයි. අනතුරුව, වෙළඳ සහායක විසින් අයිතමවල අලවා ඇති තීරු කේත (barcode) සාප්පුවෙහි ඇති තොරතුරු පද්ධතියට සුපිරික්සනු (scan) ලැබේ. එක් එක් අයිතමයේ ප්‍රමාණ ද පද්ධතියට ඇතුළු කරනු ලැබේ. පද්ධතිය මගින් සෑම අයිතමයකම පිරිවැය සහ සියලු අයිතමවල මුළු පිරිවැය ගණනය කරනු ලැබේ. ඉන්පසු, ගනුදෙනුව සඳහා බිල්පත මුද්‍රණය කරනු ලැබේ.

ඉහත තොරතුරු පද්ධතියේ ආදාන, ක්‍රියාවලි සහ ප්‍රතිදාන සඳහා **එක්** නිදසුන බැගින් ලියා දක්වන්න.

### 3. අ.පො.ස.(සා.පෙළ) 2019 (1 - i)

කොළඹ කාලගුණ මධ්‍යස්ථානය මගින් එක් මසක දෛනික වර්ෂාපතන අගයන් වාර්තා කරගනු ලබයි.

ඉහත සඳහන් කරන ලද දෛනික වර්ෂාපතන දත්ත සැකසීමෙන් (processing) ලබා ගත හැකි තොරතුරු (information) සඳහා උදාහරණ **දෙකක්** ලියන්න.

### 4. අ.පො.ස.(සා.පෙළ) 2019 (2 –iii (C))

ශිෂ්‍යයින්ගේ අධ්‍යයන කටයුතු පහසු කිරීමට තම පාසලේ ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් (Learning Management System (LMS) ආරම්භ කිරීමට විදුහල්පතිතුමියකට අවශ්‍ය වේ. භාවිතයට නොගත් නව පරිගණකයක් ඒ සඳහා යොදාගැනීමට අදහස් කෙරේ. මෙම පද්ධතිය හරහා ශිෂ්‍යයින්ට ලබාගත හැකි ප්‍රතිලාභය ලියා දක්වන්න.

5. **අ.පො.ස.(සා.පෙළ) 2020 (1 - i)**

පාසල් හා උසස් අධ්‍යාපනික ආයතනවල පරිපාලනය සඳහා ඉගෙනුම් කළමනාකරණ පද්ධති යොදාගැනුම පොදු භාවිතයක්ව පවතී. ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් මගින් සිසුනට ලබා දෙන පහසුකම් **දෙකක්** ලියන්න.

6. **අ.පො.ස.(සා.පෙළ) 2020 (6 - ii)**

නිමල් ඔහුගේ පුතුට මුදල් යැවීම සඳහා මාර්ගගත (online) බැංකු පද්ධතියකට පූරණය (logged) වේ. නිමල් ඔහුගේ පුතුගේ ගිණුම් අංකය සහ මාරු කළයුතු මුදල් ප්‍රමාණය ඇතුළත් කරනු ලබයි. මෙම ගනුදෙනුව අනුමත කිරීම සඳහා පද්ධතිය මගින් පුද්ගල හැඳුනුම් අංකයක් (PIN) ඉල්ලා සිටියි. PIN අංකය තහවුරු කරගත් පසු, පද්ධතිය සියලු මුදල් මාරු කිරීමේ විස්තර පෙන්වනු ලබන අතර, නිමල්ගෙන් අවසන් අනුමත කිරීම (OK) ලබාගනී. සාර්ථක ගනුදෙනුවක අවසානයේදී, නිමල්ට e-රිසිට් පතක් ලැබේ.

ඉහත සංසිද්ධිය සඳහා, ආදාන **දෙකක්**, සැකසුම් **දෙකක්** සහ ප්‍රතිදාන **දෙකක්** ලියා දක්වන්න.

7. **අ.පො.ස.(සා.පෙළ) 2021 (1 - i)**

එක්තරා පාසලක ගුරුවරු පරිගණක පද්ධතියකට සම්බන්ධ කර ඇති ඇඟිලි සලකුණු යන්ත්‍රයක් භාවිතයෙන් පැමිණීම සටහන් කිරීමට අපේක්ෂා කරති. මෙම පද්ධතිය මගින් මාසිකව පැමිණීමේ වාර්තාවක් ජනනය කරයි. ඉහත තොරතුරු පද්ධතියේ ආදානයක් සඳහා **එක්** උදාහරණයක් සහ ප්‍රතිදානයක් සඳහා **එක්** උදාහරණයක් ලියා දක්වන්න.

8. **අ.පො.ස.(සා.පෙළ) 2022 (1 - i)**

රෝගීන්ට ඇතිවන අපහසුතා අවම කිරීමට පරිගණකගත හමුවීම් වේලාවන් (appointment) තියමකරන (scheduling) පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට රෝහලක බාහිර රෝගී අංශයක් (OPD) තීරණය කරයි. දහවල් 12 – ප.ව. 1 තෙක් ආහාර විවේකයක් සමගින් මෙම අංශය සෑම දිනකම පෙ.ව. 8 සිට ප.ව. 5 තෙක් රෝගීන්ට විවෘත ය. සෑම පැයක්ම විනාඩි 15 කාලච්ඡේද හතරකට බෙදා, එවැනි එක් කාලච්ඡේදයක් රෝගීන් තුන් දෙනෙක් සඳහා වෙන් කිරීමට මෙම අංශය සැලසුම් කරයි.

සිදුකළ සෑම හමුවීම් වේලා වෙන්කිරීමක් සඳහාම, යෝජිත පරිගණක පද්ධතියේ, තොරතුරු **පහක්** ආචය කෙරේ. රෝගියාගේ ජාතික හැඳුනුම්පත් අංකය, නම සහ දුරකථන අංකය ඒවායින් තුනකි. ඉතිරි තොරතුරු **දෙක** ලියා දක්වන්න.

9. **අ.පො.ස.(සා.පෙළ) 2022 (7 - i)**

A සිට D තෙක් ඇති ලේබල මගින් දක්වන විස්තර පහත දී ඇති ලැයිස්තුවේ නිවැරදි පද හා ගළපන්න. එක් එක් ලේබලය ඉදිරියෙන් එයට ගැළපෙන පදයේ අංකය **ලේබලය ⟶ පදයේ අංකය** ආකාරයෙන් ලියා දක්වන්න.

| ලේබලය | විස්තරය |
|---|---|
| A | දුරස්ථ රෝගීන් ICT භාවිතයෙන් රෝහල් විශේෂඥ ඒකක සමග සම්බන්ධ වීම ' |
| B | ගුරුවරුන්ට/සිසුන්ට ඉගැන්වීමට/ඉගෙන ගැනීමට උදව් වන යෙදුමක් |
| C | ශරීරයේ අභ්‍යන්තර කොටස්වල සවිස්තරාත්මක රූප සටහන් ගොඩනැගීම |
| D | අන්තර්ජාලය හරහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීම හා විකිණීම සහ විකුණුම් සම්පූර්ණ කිරීමට සංචිත (funds) සහ දත්ත හුවමාරුව |

**ලැයිස්තුව :** {1 – හෘද රෝග තිරගැන්වීම (Cardiac screening), 2 – ඊ-බැංකු (Electronic Banking), 3 – ඊ-වාණිජ්‍යය (Electronic commerce), 4 – ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS), 5 – චුම්භක අනුනාද අනුරූකරණය (MRI), 6 – දුරස්ථ සෞඛ්‍ය පුහුණුව (Medical Teletraining), 7 – පාසල් කළමනාකරණ පද්ධතිය, 8 – දුරස්ථ සෞඛ්‍ය රැකවරණය (Telemedicine)}

## පිළිතුරු

1. **අ.පො.ස.(සා.පෙළ) 2016 (1 - iv)**

ආදාන - රහස් අංකය/ආපසු ගන්නා මුදල/ කාඩ් පතෙහි තොරතුරු

ක්‍රියාවලිය - ගිණුම් ශේෂය යාවත්කාලීන කිරීම/ සැසඳීම/අවශ්‍ය මුදල සහ ශේෂය පරීක්ෂා කිරීම/රහස් අංකයේ වලංගුතාව පරීක්ෂා කිරීම

ප්‍රතිදාන- ගිණුම් ශේෂය/මුදල්/රිසිට් පත/කාඩ් පත

2. **අ.පො.ස.(සා.පෙළ) 2017 (1 - iv)**

ආදාන - තීරු කේත, එක් එක් අයිතම ප්‍රමාණය

ක්‍රියාවලිය - තීරු කේත හඳුනා ගැනීම (අර්ථකථනය) / පරිවර්තනය, අයිතම පිරිවැය / වටිනාකම ගණනය කිරීම, සියලුම අයිතමවල මුළු පිරිවැය / වටිනාකම ගණනය කිරීම

ප්‍රතිදානය - බිල්පත

3. **අ.පො.ස.(සා.පෙළ) 2019 (1 - i)**

- වර්ෂාපතනයේ සාමාන්‍ය අගය
- උපරිම වර්ෂාපතනය
- අවම වර්ෂාපතනය
- වර්ෂාපතනයේ මාතය
- වර්ෂාපතනයේ මධ්‍යනය
- වර්ෂාපතනයේ විචලනය // වැසි සහිත දින ගණන // අඛණ්ඩ වැසි සහිත දින ගණන
- අනාගතය සඳහා වර්ෂාපතනයේ අනාවැකි
- මුළු වර්ෂාපතනය

4. **අ.පො.ස.(සා.පෙළ) 2019 (2–iii (C))**

- අධ්‍යයන සටහන්/අතිරේක අධ්‍යයන ද්‍රව්‍ය ලබා ගැනීම
- ප්‍රතිපෝෂණය (feedback) / ප්‍රතිඵල ලබා ගැනීම (ගුරුවරුන්ගෙන්)
- Online assignment/tutorial submissions
- මාර්ගගත ප්‍රශ්ණාවලි සඳහා සහභාගී වීම
- සාකච්ඡා / සංවාද මණ්ඩප (forums) සඳහා සහභාගී වීම//ගුරුවරු/සිසුන් සමඟ සන්නිවේදනය
- දැන්වීම් ලබා ගැනීම
- පහසුවෙන් ඉගෙනීම// කඩදාසිවලවැඩ අඩුවීම// ඕනෑම වෙලාවක/ඕනෑම තැනක සිට ඉගෙනීම// තමන්ට කැමති වේගයකින් ඉගෙනීම
- බහුවිධ ක්‍රම ඇති නිසා හොඳින් ඉගෙනුම/නැවුම් අත්දැකීම

5. **අ.පො.ස.(සා.පෙළ) 2020 (1 - i)**

- ඕනෑම තැනක සිට ඉගෙනීම
- නිවසේ සිට පැවරුම් උඩුගත කිරීම
- සංවාද මණ්ඩපවලට/සංසදවලට සහභාගී වීම

- වීඩියෝ සමඟින් ක්‍රියාකාරකම්වලට සහභාගීවීම
- දේශන ද්‍රව්‍ය/වීඩියෝ බාගත කිරීම
- ලකුණු දැකගැනීම/දැන්වීම් දැකගැනීම
- ගොනු බෙදා හදා ගැනීම
- ඕනෑම වේලාවක ඉගෙනීම
- මාර්ගගත විභාග

6. **අ.පො.ස.(සා.පෙළ) 2020 (6 - ii)**

- ආදාන : ගිණුම්අංකය, මුදල්ප්‍රමාණය, පුද්ගලහැඳුනුම්අංකය(PIN), අවසන්අනුමතකිරීම (OK)
- ප්‍රතිදාන : පුද්ගලහැඳුනුම්අංකයඉල්ලාසිටීමේපණිවුඩය, සියලුමමුදල්මාරුකිරීමේපෝරමයපෙන්වීම, e-රිසිට්පත
- ක්‍රියාවලි : PIN තහවුරුව, විස්තර පෙන්වීම, රිසිට් පත ජනනය කිරීම, මුදල් ප්‍රමාණය තහවුරුව

7. **අ.පො.ස.(සා.පෙළ) 2021 (1 - i)**

ආදාන - ඇඟිලි සලකුණ

ප්‍රතිදාන - මාසික පැමිණීමේ වාර්තාව

8. **අ.පො.ස.(සා.පෙළ) 2022 (1 - i)**

දිනය

වේලාව/කාල පරාසය/කාලය/කාලච්ඡේදය

9. **අ.පො.ස.(සා.පෙළ) 2022 (7 - i)**

A – 8

B – 4

C – 5

D - 3